## නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක(කෘෂි ව්‍යාප්ති), III ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක(කෘෂි ව්‍යාප්ති), III ශ්‍රේණිය තනතුරට පළාත් කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති **නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2017.11.23** දින වේ. මෙම විභාගය ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකිතාක් ආසන්න දිනෙක, නැගෙනහිර පළාතේ නගර හතරකදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**02. බඳවා ගැනීම සඳහා වන සේවා කොන්දේසි ඃ-**

2.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

2.2 මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන්, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ. මෙම තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ පළාත් කුසලතා අනුපිළිවෙල මත, සම්මුඛ පරීක්ෂණයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කොට බඳවා ගනු ලැබේ.

2.3 මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය. එමෙන්ම නැගෙනහිර පළාතේ අවුරුදු 10 ක අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වේ.

2.4 ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමේදී දැනටමත් රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත සුදුසුකම් ඇති අය තම තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ අයදුම් කිරීමේදී ඉහත සඳහන් තනතුරට අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය එම තනතුරෙන් මුදාහැරිය හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා අනුමත නොකළ අයදුම්පත් ඉදිරිපත් කරන අය මෙම තනතුරට තෝරාගත හොත් නව පත්වීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**03 වැටුප ඃ-** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුව, (MT-1-2016)
රු.29,840-10x300-11x350-10x560-10x660- රු. 48,890/- වේ.

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදුකරනු ලැබේ.

**04 බඳවා ගැනීම සඳහා වන මූලික සුදුසුකම් ඃ-**

**4.1 වයස් සීමාව ඃ-**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

**4.2 අධ්‍යාපන සුදුසුකම් ඃ-**

4.2.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව(සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ගණිතය සහ විද්‍යාව ඇතුළුව සම්මාන 05 ක් සහිතව එකවර විෂයයන් හයකින් සමත් වී තිබීම.

**4.3 වෘත්තීය සුදුසුකම් ඃ-**

4.3.1 රජය විසින් පිළිගත් ආයතනයක් මඟින් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ වසර දෙකක ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

4.3.2 තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q.-5) 05 මට්ටමේ නිපුණතාවයක් තනතුරට අදාළව ලබා තිබීම.

## 05. පොදු සුදුසුකම් ඃ-

5.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

5.2 අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

5.3 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් අවම වශයෙන් එක් (01) අවුරුද්දක්වත් අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචි වී සිටීම.

හෝ

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් අවම වශයෙන් අවුරුදු තුනක්වත් (03) අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචිව සිටින අයෙකු සමඟ ආවාහ/විවාහ වී වෙනත් පළාතක සිට මෙම පළාතට පැමිණ ඒ බව සනාථ කළ හැකි ලේඛන ඉදිරිපත් කළ හැකි අයෙකු වීම.

**සටහන ඃ-** **ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.**

## 06 බඳවා ගැනීමේ ක්‍රමය ඃ-

6.1 නැගෙනහිර පළාත් සභාව සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට, රජයේ චක්‍රලේඛවලට හා ඉහත 2.2 හි සඳහන් විධිවිධානවලට අනුකූලව බඳවා ගනු ලැබේ. ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබයි. එහිදී මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලබන අතර, අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ. ලිඛිත විභාගය පැවැත්වීම, ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ.

6.2 මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සඳහා පළාත් කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

6.3 සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 07. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් ඃ-

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. ඉහත 6.3 පිළිබඳ අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

## 08. විභාග ගාස්තු ඃ-

විභාග ගාස්තුව රු. 300/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.) කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකටද මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.**

**09.** **අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

9.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 6.0 සිට 12.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

9.2 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිවැරදිව සම්පූර්ණ කර නොමැති හා අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

9.3 මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඉහත සඳහන් කර ඇති විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"EX/Rec/17/19"** යන්න සඳහන් කළ යුතුය.

9.5 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 2,92,080 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. **රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් අයදුම්කරන්නේ නම්,** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර එවිය යුතුය.

9.6 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2017.11.23** වැනි දින හෝ ඊදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපෑලේදී අස්ථානගතවන අයදුම්පත්‍ර පිළිබඳ කිසිදු වගකීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගනු නොලැබේ. **(ඉල්ලුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.)**

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**නැගෙනහිර පළාත,**
**අංකඃ 198, ඇතුල් වරාය පාර,**
**ත්‍රිකුණාමලය.**

**10.** අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

**i.** ජාතික හැඳුනුම්පත. **ii.** වලංගු විදේශ ගමන් බලපත්‍රය. **iii.** වලංගු රියදුරු බලපත්‍රය.

**11.** විභාගය පැවැත්වීම සඳහා යෝජිත ප්‍රධාන නගර හා එහි අංකයන් පහත සඳහන් වේ.

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 01 | අම්පාර | 03 |
| මඩකලපුව | 02 | කල්මුණේ | 04 |

සැ.යු. **යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.**

**12. විභාග පරිපාටිය ඃ-**

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්ණ පත්‍රය | මුළු ලකුණු | කාලය | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතාවය | 100 යි | පැය 01 යි | 40 % |
| තාක්ෂණික දැනුම | 100 යි | පැය 02 යි | 40 % |

**අභියෝග්‍යතාවයඃ-**

මෙම ප්‍රශ්න පත්‍රය මඟින් අපේක්ෂකයාගේ සංඛ්‍යාණමය හැකියාව, තාර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරික්ෂා කිරීමේ ප්‍රශ්න වලින් සමන්විත වේ.

**තාක්ෂණික දැනුම ඃ-**

මෙම ප්‍රශ්න පත්‍රය, අයදුම්කරුවන්ගේ තාක්ෂණික දැනුම සහ විෂයය කරුණු පිළිබඳව පරික්ෂා කරන ප්‍රශ්නවලින් සමන්විත වේ.

1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය
    - දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය
    - රැකියා නිර්මාණය
    - කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ ආනයන හා අපනයන තත්වය

2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම

3. පස හා ශාඛ පෝෂණය
    - භෝග වගාව කෙරෙහි පසේ ස්වභාවය, ව්‍යුහය, තෙතමනය, ලවනතාවය, භෞතික හා රසායනික තත්ත්වයන්ගෙන් ඇතිවන බලපෑම
    - ශාඛ සඳහා පසේ පෝෂණය සහ ශාඛ පෝෂණ කළමනාකරණය
    - ශාඛ පෝෂණය පිළිබඳ විශේෂ ලක්ෂණ හා කරුණු

4. වී නිෂ්පාදනය
    - පාංශු දේශගුණික අවශ්‍යතාවය
    - ප්‍රභේද
    - බිම සකස් කිරීම හා තවාන් කළමනාකරණය
    - පළිබෝධ හා රෝග පාලනය
    - පොහොර යෙදීම
    - ජල කළමණාකරණය/අස්වනු වැඩිකර ගැනීමේ නවීන ක්‍රමවේදය
    - අස්වනු හා පසු අස්වනු තාක්ෂණය

5. වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය
    - ලොකුළූනු, මිරිස්, අර්තාපල්, බඩඉරිගු, සහ වෙනත් බෝගවල ප්‍රභේද

6. එළවළු නිෂ්පාදනය
    - එළවළු තවාන් කළමනාකරණය
    - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති එළවළු වර්ග හඳුන්වාදීම හා රෝපණ කටයුතු, අස්වනු නෙලීම හා සැකසීම
7. පළතුරු
    - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති පළතුරු වර්ග හඳුන්වාදීම හා වගා කිරීම.

8. භෝග ආරක්ෂණය
    - භෝග වගාවන්ට වැළදෙන ප්‍රධාන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම හා ඒවා කළමනාකරණය කරන ක්‍රම
    - වල් පැළෑටි, වල් පැළෑටි මර්ධනය කරන ක්‍රම
    - පළිබෝධ නාශක භාවිතයේදී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම

9. ජල වහනය හා එහි වැදගත්කම

10. පාංශු රසායන
    - පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

11. වාරිමාර්ග හා ජල කළමණාකරණ
    - විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ජල කළමනාකරණය
    - ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම

12. ගොවිපල් යාන්ත්‍රීකරණය
    - ගොවිපල් යාන්ත්‍රිකරණයේ වාසි හා අවාසි
    - පොළොව සකස් කිරීමට භාවිතා කරන කෘෂියන්ත්‍රෝපකරණ
    - ජල සම්පාදනය හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
    - ඉහත යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව

13. මී මැසි පාලනය
    - ආර්ථික වැදගත්කම
    - මී මැසි ජනපද ඇති කිරීම හා පවත්වා ගෙන යාම
    - අස්වනු ලබා ගැනීම හා වෙළඳ පොළ සඳහා සකස් කිරීම

14. මල් වගාව හා භූමි අලංකරණය
    - ආර්ථික වැදගත්කම
    - භූමි අලංකරණ ක්‍රම
    - කැපූ මල් සකස් කොට වෙළඳ පොළට නිෂ්පාදනය කිරීම

15. ආරක්ෂිත භෝග වගාව
    - වැදගත්කම
    - සැලසුම
    - භෝග තෝරා ගැනීම
    - පවත්වාගෙන යාම හා අස්වනු සකස් කිරීම

16. සත්ත්ව පාලනය
    - කුකුල් පාලනය හා කිරි ගව නිෂ්පාදනය
    - මිශ්‍ර භෝග කළමනාකරණය යටතේ සත්ත්ව පාලනය පවත්වාගෙන යාම

17. කෘෂිකාර්මික ව්‍යාප්තිය
    - කෘෂිකාර්මික ව්‍යාප්තියේ ක්‍රමවේදය හා උපාය මාර්ග
    - කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම

18. පටක රෝපණය
    - පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම
    - පටක රෝපණ භාවිතය/භාවිතයේ උදාහරණ
    - පටක රෝපණයේ වාසි අවාසි

19. ශාක ආරක්ෂණ රෙගුලාසි පිළිබඳ දැනුම
    - ශාක ආරක්ෂණ නීති රෙගුලාසි පිළිබඳ දැනුම
    - ශාක ආරක්ෂණ ක්‍රමවේදය

20. ශාක සංරක්ෂණය
    - ශාක සංරක්ෂණයේ වැදගත්කම(ශාඛ/ජාන ජ්ලාස්ම)
    - ශාක සංරක්ෂණ ක්‍රම (ශාඛ/ජාන ජ්ලාස්ම)

21. ජෛව තාක්ෂණය
    - DNA වල වැදගත්කම
    - ''ජානය'' යනු කුමක්ද? හා එහි ක්‍රියාකාරීත්වය
    - ජාන ඉංජිනේරු තාක්ෂණ ක්‍රමය මඟින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව

22. කෘෂිකර්ම සංවර්ධනය

    වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම, කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, ඒකක හා ඒවායේ කාර්ය භාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාරවන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල යහපත් හා අයහපත් බලපෑම්.

මෙම දැන්වීමෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම විභාගය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත පත්කිරීම් බලධාරියා සතු වේ.

අයි.කේ.ජී. මුතුබණ්ඩා,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.